A

# නිවේදනය

## පාර්ලිමේන්තුවේ කටයුතු සජීවීව විකාශය කිරීම

ගරු මන්ත්‍රීවරුනි, ජනතා නියෝජිතයන් ලෙස ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරයට ලබාදෙන සක්‍රිය දායකත්වය රටේ සමස්ත ජනතාවට දැක බලා ගැනීමේ අවස්ථාව උදා කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන 2015 ඔක්තෝබර් මස 08 වැනි බ්‍රහස්පතින්දා එනම් අද දින සිට පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන සෑම දිනකම සීමිත කාලයක් ජාතික රූපවාහිනී නාලිකාව සහ ගුවන් විදුලිය ඔස්සේ පාර්ලිමේන්තුවේ කටයුතු සජීවී ලෙස විකාශය කිරීමට අවශ්‍ය සියලු කටයුතු සලසා තිබෙන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

තවද, මෙය බොහෝ දුෂ්කරතා මධ්‍යයේ ආරම්භ කළ නව ප්‍රවණතාවයක් බැවින් එය සාර්ථක කර ගැනීමට ඔබතුමන්ලා සියලු දෙනාගේම කාරුණික සහයෝගය මා අපේක්ෂා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සෑම රටකම මෙය දැනටමත් ක්‍රියාත්මක වන බැවින් පාර්ලිමේන්තුවේ ගෞරවය රැකෙන ආකාරයෙන් මෙම නව ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වාගෙන යාමට අප සියලුදෙනාම කටයුතු කරමු.